| **20.03.04.00** | රජයේ නිලධාරීන්ට යතුරුපැදි ලබාදීම | | | - | |
| **20.03.07.00** | කෘෂිකර්ම | | | 212.30 | |
| | | | | 620,573.03 | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු(000)

| | වෙන්කරනලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන/අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ %ලෙස |
|---|---|---|---|---|
| **ප්‍රතිපාදන වර්ගය** | **මුල් ප්‍රතිපාදනය** | **අවසාන ප්‍රතිපාදනය** | | |
| පුනරාවර්තන | 2,405,000.00 | 2,405,000.00 | 2,321,901 | **96.54** |
| ප්‍රාග්ධන | 518,000.00 | 518,000.00 | 469,786 | **90.69** |
| | **2,923,000.00** | **2,923,000.00** | **2,791,687** | **95.51** |

**3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන**

**රු(000)**

| අනු අංකය | අමාත්‍යාංශය | ප්‍රතිපාදනයේ අරමුණ | මුල් ප්‍රතිපාදනය | අවසන් ප්‍රතිපාදනය | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදනය, ලබාදුන් අවසන් ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| 1 | බුද්ධ සාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය | 5065.89 | 5065.89 | 4750.88 | 93.78 |
| | | ආගමික කටයුතු නගා සිටුවීම | 2540.73 | 2540.73 | 2275.08 | 89.54 |
| | | ජාතික උරුම ප්‍රසාංග කලා හා ජනකලා ප්‍රවර්ධර්නය | 23.87 | 23.87 | 23.87 | 100.00 |
| 2 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා(කාර්මික අපනයන අංශය) | 19689.03 | 19689.03 | 19567.61 | 99.38 |
| 3 | ආරක්ෂක අමාත්‍යාංශය | ආපදා සහන මෙහෙයුම් | 80956.08 | 80956.08 | 80147.29 | 99.00 |
| 4 | අධිකරණ බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සමථ මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීම | 22302.60 | 22302.60 | 20210.12 | 90.62 |
| | | ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධනය | 15379.41 | 15379.41 | 15379.41 | 100.00 |
| 5 | සෞඛ්‍ය අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 18545.07 | 18545.07 | 18531.52 | 99.93 |
| | | බෝවන සහ බෝ නොවන රෝග පාලනය | 8200.00 | 8200.00 | 7940.95 | 96.84 |
| 6 | විදේශ කටයුතු අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 1048.80 | 1048.80 | 0.00 | 0.00 |
| 7 | ප්‍රවාහන අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 2300.00 | 2300.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 10120.40 | 10120.40 | 0.00 | 0.00 |
| | | | 4583.51 | 4583.51 | 0.00 | 0.00 |
| | | | 126.35 | 126.35 | 0.00 | 0.00 |
| 9 | ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය | .ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන | 67937.69 | 67937.69 | 67937.69 | 100.00 |
| | | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 3250.00 | 3250.00 | 3250.00 | 100.00 |
| | | මහා මාර්ග සංවර්ධනය(කි.මී. 10000 මාර්ග සංවර්ධන වැඩසටහන) | 20.00 | 20.00 | 20.00 | 100.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | කෘෂිකර්ම අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 42007.31 | 42007.31 | 40094.23 | 95.45 |
| | | පරිපාලන හා ආයතනික සේවා | 1797.70 | 1797.70 | 1792.47 | 99.71 |
| | | පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය | 6930.00 | 6930.00 | 1977.38 | 28.53 |
| | | පොහොර සැපයීම සහ පොහොර නියාමනය කිරීම සහ කෘමිනාශක භාවිතය | 823481.05 | 823481.05 | 298.10 | 0.04 |
| | | කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන | 308.00 | 308.00 | 227.26 | 73.79 |
| 11 | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 22709.82 | 22709.82 | 21818.95 | 96.08 |
| | | ඉඩම් සංවර්ධන හා ඉඩම් අත්පත් කරගැනීම | 43764.56 | 43764.56 | 21987.67 | 50.24 |
| 12 | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | ඉදිකිරීම් කර්මාණ්ත සංවර්ධනය කිරීම, නිවාස අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම සහ නැවත පදිංචි කිරීම | 320.29 | 320.29 | 320.29 | 100.00 |
| 13 | අධ්‍යාපන අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන) | 1411.26 | 1411.26 | 1298.26 | 91.99 |
| | | විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය | 7761.39 | 7761.39 | 7511.63 | 96.78 |
| | | වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධනය | 830.62 | 830.62 | 829.96 | 99.92 |
| 14 | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා(රාජ්‍ය භාෂා) | 150.00 | 150.00 | 150.00 | 100.00 |
| | | ස්වදේශ කටයුතු | 1819.76 | 1819.76 | 1791.90 | 98.47 |
| | | ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලනය | 1247359.87 | 1247359.87 | 1243487.07 | 99.69 |
| | | ආයතන හා පරිපාලන සේවා (රාජ්‍ය පරිපාලන) | 336369.77 | 336369.77 | 308186.53 | 91.62 |
| 15 | කර්මාණ්ත අමාත්‍යාංශය | කර්මාණ්ත සංවර්ධන වැඩසටහන | 27127.13 | 27127.13 | 26319.85 | 97.02 |
| 16 | පරිසර අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 17486.30 | 17486.30 | 16876.32 | 97.02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | පරිසර සංරක්ෂණය | 14535.93 | 14535.93 | 7460.04 | 51.32 |
| 17 | ජල සම්පාදන අමාත්‍යාංශය | ග්‍රාමීය හා ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධනය | 50.00 | 50.00 | 50.00 | 100.00 |
| 18 | කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 144.00 | 144.00 | 127.19 | 88.32 |
| | | ගම්මාන සවිබල ගැන්වීම හා ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම | 188657.81 | 188657.81 | 184144.57 | 97.61 |
| | | කාන්තා සංවර්ධනය | 3114.43 | 3114.43 | 2454.52 | 78.81 |
| | | සමාජ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 445775.10 | 445775.10 | 445388.43 | 99.91 |
| | | ළමා සංවර්ධනය | 331321.79 | 331321.79 | 323908.42 | 97.76 |
| | | ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම සහ වසංගත රෝග පාලනය | 804560.78 | 804560.78 | 803814.98 | 99.91 |
| 19 | තාක්ෂණ අමාතශය | රාජ්‍ය ආයතන , විශේෂ ආයතන සහ සංවර්ධන ව්‍යාපෘති | 1012.75 | 1012.75 | 636.40 | 62.84 |
| 20 | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 1261.24 | 1261.24 | 1257.46 | 99.70 |
| | | | 76.19 | 76.19 | 63.03 | 82.72 |
| 21 | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | පරිපාලන හා ආයතනික සේවා | 3195.03 | 3195.03 | 3021.43 | 94.57 |
| | | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සහ ඵලදායිතා ප්‍රවර්ධනය | 1490.52 | 1490.52 | 1185.81 | 79.56 |
| 22 | ක්‍රීඩා හා යෞවන තටයුතු අමාත්‍යාංශය | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 19195.24 | 19195.24 | 19167.74 | 99.86 |
| | | ක්‍රීඩා සංවර්ධනය | 3185.00 | 3185.00 | 3139.97 | 98.59 |
| | | තරුණ සංවර්ධනය | 6440.23 | 6440.23 | 4270.12 | 66.30 |
| 23 | වාරිමාර්ග අමාත්‍යාංශය | වාරිමාර්ග සංවර්ධන වැඩසටහන(වාරි සෞභාග්‍ය) | 4212.79 | 4212.79 | 3144.21 | 74.63 |
| 24 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | සාමාන්‍ය පරිපාලනය | 346.02 | 346.02 | 153.48 | 44.36 |
| | | බෞද්ධ ආගමික කටයුතු ප්‍රවර්ධනය | 53061.56 | 53061.56 | 49048.37 | 92.44 |
| 25 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය | 6252.00 | 6252.00 | 5429.41 | 86.84 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | ක්‍රිස්තියානි ආගමික, සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම | 3874.64 | 3874.64 | 3713.24 | 95.83 |
| 27 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ප්‍රකාශන හා සාහිත්‍ය කටයුතු | 1027.63 | 1027.63 | 976.23 | 95.00 |
| | | කලා හා ශිල්ප වර්ධනය | 7444.58 | 7444.58 | 6768.45 | 90.92 |
| 28 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | ප්‍රවෘත්ති ප්‍රචාරය | 226.80 | 226.80 | 124.40 | 54.85 |
| 29 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | සමාජ සේවාවන් සඳහා මුදල් ආධාර | 42124.11 | 42124.11 | 38630.46 | 91.71 |
| | | පුනරුත්තාපන හා පුනුණුකිරීම | 5470.29 | 5470.29 | 4948.30 | 90.46 |
| 30 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | පරිවාස හා ළමාරක්ෂක සේවා | 6339.40 | 6339.40 | 6134.43 | 96.77 |
| 31 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ක්‍රී ඩා සංවර්ධනය | 1768.10 | 1768.10 | 1521.74 | 86.07 |
| 32 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | පුද්ගලයින් ලියාපදිංචි කිරීම හා ඊට අදාල කටයුතු | 41272.99 | 41272.99 | 40514.96 | 98.16 |
| 33 | සුරාබදු දෙපාර්තමේන්තුව | සුරාබදු ආඥා පනත හා දුම්කොල බදු පරපාලනය සහ මත්පැන් කර්මාණ්තය නියාමනය කිරීම | 395.30 | 395.30 | 0.00 | 0.00 |
| 34 | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | මෙහෙයුම් වැඩසටහන ජාතික සංඛ්‍යා ලේඛණ | 2017.57 | 2017.57 | 1587.99 | 78.71 |
| 35 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා | 399.68 | 399.68 | 276.90 | 69.28 |
| | | විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම | 689505.33 | 689505.33 | 667765.19 | 96.85 |
| 36 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා | 300.48 | 300.48 | 300.48 | 100.00 |
| | | ලියාපදිංචි කිරීමේ කටයුතු | 246.70 | 246.70 | 53.21 | 21.57 |
| 37 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | පරිපාලන හා ආයතනික සේවා | 7014.00 | 7014.00 | 6978.85 | 99.50 |
| 38 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | අන්තර් පළාත් ඉඩම් සංවර්ධනය | 2360.57 | 2360.57 | 2309.46 | 97.83 |
| 39 | පේෂකර්ම දෙපාර්තමේන්තුව | පරිපාලන හා ආයතනික සේවා | 25204.38 | 25204.38 | 24467.88 | 97.08 |
| 40 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාත්මක කිරීම | 2917.84 | 2917.84 | 1961.28 | 67.22 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 41 | කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව | කළමණාකරණ විගණන පරිපාලනය | 20.00 | 20.00 | 18.17 | 90.87 |
| 42 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | පරිපාලන හා ආයතනික සේවා | 45.00 | 45.00 | 44.99 | 99.98 |
| 43 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | ඉඩම් පරිහරණ සැලසුම් හා ඉඩම් සංවර්ධන වැඩසටහන් | 2439.97 | 2439.97 | 2015.07 | 82.59 |
| 44 | මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව | පරිපාලන හා ආයතනික සේවා | 1980.92 | 1980.92 | 1731.73 | 87.42 |
| | | මිනිස් බල රැකී රක්ෂා සංවර්ධනය | 437.00 | 437.00 | 343.72 | 78.66 |
| | | | 97.28 | 97.28 | 0.00 | 0.00 |
| 45 | බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව | සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා | 918234.74 | 918234.74 | 779539.10 | 0.85 |

**3.8 මූල්‍ය නොවන වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 1,662,241 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ හා වාහන | | 603,423 | | |
| 9153 | ඉඩම් | | 2,230,790 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙනලද වත්කම් | | | | |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. NWCG/KR/A/DSK/2022/ACC/70

මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 26 දින

ගණන්දීමේ නිලධාරී,

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 තත්ත්වාගණනය කළ මතය

---

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.3 (උ) | රජය සතු වටිනා දේපළ පැවරීමේදී ඒ ගැන සොයාබලා පැවරිය යුතු දේපළ පමණක් විධිමත් පරිදි පැවරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 3.2 (ඒ) |
| 3.3 (එ) | රජයට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අල්ලා ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 3.2 (ඔ) |
| 3.7 (ඈ) | වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, රජයට සිදුවී ඇති අලාභය අයකරගත යුතු වීම. | 3.5 (අ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

ACA – 2(i) ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වූ වියදම රු.3,981,462 ක් ලෙස දක්වා ඇතත්, භාණ්ඩාගාර SA-82 ආකෘතිය අනුව එම වියදම රු.4,110,007 ක් ලෙස දක්වා තිබීමෙන් රු.128,545 ක වෙනසක් තිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුලියාපිටිය (නැගෙනහිර), උඩුබද්දාව, මාස්පොත, මල්ලවපිටිය, රස්නායකපුර හා ගල්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් ස්ථාපිත කර ඇති ඉඩම්වල වටිනාකම තක්සේරු කර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් සඳහා ලබාදී තිබූ ජල බවුසර් සහිත ලොරි රථ 04 පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු ට්‍රැක්ටර් හා බවුසර් ටේලර් රථ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරා දීමට කටයුතු කර තිබුණ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් හා බවුසර් ටේලර් රථ 25 ක් සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් හා ටේලර් රථ 20 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණද එම වත්කම්වල අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) වැය විෂය අංක 2509 යටතේ ගම සමඟ පිළිසඳර වැඩසටහන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුකරන ලද ගොඩනැගිලි, සේවා පියස / නිල සේවන ඇතුළු වෙනත් ඉදිකිරීම් සුදුසු පරිදි පවරාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අලුත්ම තත්ත්වයේ පවතින අංග සම්පූර්ණ නිල නිවස රු.6,229,500 ක වටිනාකමකට තක්සේරු කර ඇතත්, එම තක්සේරු වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.12,626,297 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශනවල රු.11,539,037 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,087,260 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස සම්බන්ධයෙන් ලබාදී ඇති වාර්තා අනුව, නිල නිවාස 34 ක තක්සේරු වටිනාකම රු.97,575,925 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වටිනාකම රු.81,697,976 ක් ලෙස දැක්වීමෙන් රු.15,877,949 ක වටිනාකමක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ගිණුමේ නේවාසික නොවන ගොඩනැගිලි ගිණුමේ සහ යන්ත්‍රෝපකරණ ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති අවසාන ශේෂයන් හා 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයන් අතර පිළිවෙලින් රු.3,106,940 ක් වැඩියෙන්ද, රු.32,180 ක් අඩුවෙන්ද වටිනාකම් දක්වා තිබුණි.

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් දීර්ඝකාලීනව භාවිතයට ගනු ලබන නිල නිවාස 07 ක් රු.23,780,480 කට තක්සේරු කර ඇති බව දක්වා ඇතත්, අදාල වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණ අතර, එයට අදාල උපලේඛනවල ඇති ශේෂයන් සනාථ කර ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍ර තුළ පිහිටා ඇති නිල නිවාස 07 ක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භාවිතයට ගනිමින් පැවති අතර, මෙම නිල නිවාස තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණ අතර, එයට අදාල උපලේඛනවල ශේෂයන් සනාථ කර ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 5 දක්වා වූ ප්‍රතිපාදන ඉතිරිවීම් රු.34,800,000 ක් වෙනත් වැය විෂයයන්ගේ අතිරික්ත වියදම් පියවීම සඳහා 2022 දෙසැම්බර් 29 හා 30 දිනයන්හි මාරුකර තිබීම හේතුවෙන් රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06 යටතේ වූ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2021/03 (iv) ඡේදය ප්‍රකාරව ප්‍රතිපාදන ඉතිරි වූ වැය විෂයයන් 03 ට අදාල ඉතිරිවීම් සඳහා හේතු දැක්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වී තිබුණි.

(ආ) වැය විෂයයන් 14 ක් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා රු.50,000 සිට රු.9,300,000 ක් දක්වා එනම් මුල් වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 8 සිට සියයට 117 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන වැඩිකර ගැනීමෙන් පසු වියදම් දරා තිබුණි.

(ඇ) වැය විෂයයන් 14 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ වැඩිකර ගෙන තිබූ ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 189 දක්වා පරාසයක් තුළ එනම් රු.7,868 සිට රු.989,338 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉතිරි කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඌණ උපයෝජනය කර තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ACA-2(ii) ආකෘතියේ දක්වා තිබූ වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.34,632,783 ක ඉතිරියක් සම්බන්ධයෙන් මනා සැලසුමකින් හා පාලනයකින් තොරව අධි ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් ඉතිරි වී තිබූ බැවින් ඉදිරිපත් කර තිබූ හේතූන් විගණනයේදී පිළිගත නොහැකි විය.

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයය අංක 272-1-1-0-1402 (තැපැල් හා සන්නිවේදන) යටතේ වර්ෂය අවසානයට රු.157,476 ක් වූ ඉතිරි ප්‍රතිපාදනය ඉක්මවා රු.138,308 ක බැරකම්වලට බැඳී තිබුණි.

(ආ) නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම සමඟ පිළිසඳර වැඩසටහන සඳහා 272-1-1-0-2509 වැය විෂය යටතේ වර්ෂය අවසානයට තවදුරටත් එළඹ තිබූ රු.22,398,664 ක බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල දක්වා තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක්ම සිය මුදල් වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාවට නැංවිය යුතු වුවද, එම ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශ 13 කින් හා දෙපාර්තමේන්තු 14 කින් ලද ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතුව රු.මිලියන 1,239,453.2 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ 05 කින් වැඩසටහන් 05 ක් සඳහා ලද මුළු ප්‍රතිපාදන මුදල් වූ රු.මිලියන 18,940.4 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් උපයෝජනයට ගෙන නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටුවී නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>XXIV පරිච්ඡේදයේ 14.11 වගන්තිය | වැටුප් ණය අත්තිකාරම් ලබා ඇති නිලධාරියෙකු සේවය අවසන් කළහොත්, ණය මුදලෙන් එතෙක් නොගෙවා ඇති ශේෂය එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් හෝ නීත්‍යානුකූලව අයකර ගැනීම සඳහා 23 වැනි පරිශිෂ්ඨයේ වූ විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කළ නොහැකි ප්‍රකාශයක් ලබාගත යුතු වුවද, වැටුප් ණය අත්තිකාරම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා බිංගිරිය, පඬුවස්නුවර (නැගෙනහිර), ගල්ගමුව හා මාස්පොත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 හි නිලධාරීන් 51 දෙනෙකු සඳහා අවස්ථා 70 කදී ලබාදී තිබූ එකතුව රු.10,163,998 කට අදාලව එවැනි ප්‍රකාශයක් ලබාගෙන නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

| | |
|---|---|
| (i). මුදල් රෙගුලාසි 104(4) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් NWPD-9474, PA – 4941 හා NWPC-4799 රථවලට සිදුවූ අනතුරු සඳහා පූර්ණ වාර්තාව වසරක කාලයක් ගතවී ඇතත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii). මුදල් රෙගුලාසි 1646 | පඩුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක වාහන ධාවන සටහන් හා ලොග් සටහන් පොත් නිසි පරිදි පවත්වා නොතිබුණි. |

(ඇ) රාජ්‍ය රිපාලන චක්‍රලේඛ

---

| | |
|---|---|
| (i). 2018 ජනවාරි 24 දිනැති අංක 2/2018 දරන චක්‍රලේඛය | පඩුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මානව සම්පත් සැලැස්ම ප්‍රකාරව පැය 12 ට වැඩි පුහුණු අවශ්‍යතා සම්පූර්ණ නොකළ නිලධාරීන් සංඛ්‍යාව 117 ක් විය. |
| (ii). 2022 මාර්තු 11 දිනැති අංක 03/2021(1) දරන චක්‍රලේඛය | අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පල කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති XIII පර්ව්ඡේදයේ රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් සම්බන්ධ විධිවිධානවලට අනුව සිදුකළ යුතුව තිබුණද ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් 2022 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක නිලධාරීන් 210 දෙනෙකු වර්ෂ 06 සිට වර්ෂ 22 දක්වා කාලයක් එකම කාර්යාලයේ සේවයේ නියුක්ත වී තිබුණි. |

| | | |
|---|---|---|
| (iii). | 2016 දෙසැම්බර් 29 දැනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අයත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබුණ වාහන 22 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i). | 2021 ජනවාරි 11 දිනැති හා අංක MF/NDP/01/2021 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය සහ 2021 පෙබරවාරි 10 දිනැති හා අංක MF/NDP/01/2021(i) දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය | චක්‍රලේඛයන්හි සඳහන් ක්ෂේත්‍ර 13 ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. |
| (ii). | 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක.MF/PD/01/2021 චක්‍රලේඛයේ 2.1 ඡේදය | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක අවමයක් ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි හා ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමට සහය වන භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා වෙන් කළ මුලු ප්‍රතිපාදනය වූ රු.88,241,505 කින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කර තිබුණේ මුලු ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් වූ රු.21,173,295 ක් පමණි. |

| | |
|---|---|
| (iii). 2021 ජනවාරි 11 දිනැති සහ අංක.MF/NPD/01/2021 දරන මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ 2.4 ඡේදය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජනගහනය, දරිද්‍රතාවය සහ භූමි ප්‍රමාණය යන සාධක පදනම් කරගෙන ප්‍රතිපාදන බෙදීයන ලෙස ව්‍යාපෘති තෝරා ගෙන ක්‍රියාත්මක කළ යුතු වුවත්, 2021 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක තෝරාගත් සමිති 229 ක් සඳහා අවස්ථා ගණනාවකදී විවිධ භාණ්ඩ ලබාදී තිබූ අතර, 2018 සිට 2021 වර්ෂය දක්වා තෝරාගත් සමිති 191 ක් වෙත සෑම වර්ෂයකදීම භාණ්ඩ බෙදා දී තිබුණ අතර එම වටිනාකම රු.24,704,799 ක් විය. |

(ඉ) ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛ

---

| | |
|---|---|
| 2017 ජූලි 03 දිනැති අංක.BD/GPS/130/9/14/MC-8 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරු පැදි ලබාදීම යටතේ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවිවාහක නිලධාරියෙකුට යතුරු පැදියක් ලබා දී තිබුණු අතර, එම නිලධාරියා මිය ගොස් ඇති බැවින් එම නිලධාරියාගේ දෙමව්පියන් වෙත අදාළ යතුරු පැදිය පවරා දීමට කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |

(ඊ) චක්‍රලේඛ ලිපි

---

| | |
|---|---|
| (i). ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි<br>➢ 1993 ජනවාරි 13 දිනැති සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතූ ලිපිය<br>➢ 2003 ජනවාරි 06 දිනැති ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපිය<br>➢ 2006 මාර්තු 21 දිනැති HA/DA/12/27 දරන ලිපිය | සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් තම නිල නිවසෙහි අනිවාර්යයෙන්ම පදිංචි විය යුතු වුවද, වාරියපොල හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු අංග සම්පූර්ණ තත්ත්වයේ පවතින නිල නිවාස පදිංචිය සඳහා යොදා නොගැනීම හේතුවෙන් නිල නිවස විනාශවෙමින් තිබුණි. |

(උ) වෙනත් වක්‍රලේඛ

---

ගැසට් නිවේදන

---

| | |
|---|---|
| (i). 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව කාර්ය පටිපාටි රීති 01 වන කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 202 වගන්තියේ විධිවිධානවලට අනුව ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පටිපාටියේ 2.2.2.ඡේදය | එකම සේවා ස්ථානයේ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් කළ යුතුවුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 06 සිට වසර 25 දක්වා සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් 258 දෙනෙකු සම්බන්ධයෙන් යටෝක්ත ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii). 2021 පෙබරවාරි 11 දිනැති අංක 2021/03 දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 04 ඡේදය | සමෘද්ධි සහනාධාරලාභීන් තෝරාගැනීමේදී පවුලේ ආර්ථික තත්ත්වය, වත්කම්, නිවසේ තත්ත්වය ආදිය සළකා බැලිය යුතු බව දක්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ප්‍රතිලාභීන් තෝරාගැනීමේදි මෙම කරුණු අවධානයට ලක් නොකර ප්‍රතිලාභීන් තෝරාගෙන තිබුණි. |
| (iii). 2021 ජූනි 28 දිනැති අංක.DSD/HO/SW14/19/ 01 දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | ආදායම් උත්පාදන ක්‍රියාදාමය තුළින් ඉහළ ආදායම් හිමි පවුල්, සැලකිය යුතු දෛනික ආදායම් ලබන සාමාජිකයන් සහිත පවුල් ආදිය හඳුනාගෙන සමෘද්ධි සහනාධාර ඉවත් කිරීමට කටයුතු කළ යුතු වුවත්, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය කමිටු විසින් ඒ සම්බන්ධව අවධානය යොමු කර නොතිබුණි. |

## 2.5 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 23 ක ගිණුම් අංක 6000-0-0-16-0-42 යටතේ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් එකතුව රු.126,265,499 ක් වර්ෂ 02 සිට 05 දක්වා කාලයක් නිදහස් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ගිණුම් අංක 6000-0-0-13-0-60 යටතේ තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම සඳහා වෙනත් දෙපාර්තමේන්තුවලින් ලද එකතුව රු.2,672,920 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 02 සිට 05 දක්වා කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) රජයේ සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ලැබුණු එකතුව රු.206,188,466 ක මුදලින් රු.101,282,480 ක මුදලක් වර්ෂ 05 කට අධික කාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් ගිණුම් අංක 6000-0-0-17-0-13 යටතේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබීමෙන් ඉඩම්වල හුක්තිය භාරගෙන, අත්පත් ක්‍රියාවලිය අවසන් කර වන්දි ගෙවීම් ප්‍රමාද වී තිබුණි.

(ඈ) කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 05 ට වැඩි පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.93,535,533 ක්ද, වසර 04 ට වැඩි ශේෂය රු.921,070 ක්ද විය. මෙම ශේෂයන් ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සහ අයෝජන මණ්ඩලයේ කර්මාන්ත සංකීර්ණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද ශේෂයන් වූ අතර, ඒවා වසර ගණනාවක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව මියගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් එකතුව රු.605,480 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති අතර, රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගිය ග්‍රාම නිලධාරිවරියකගෙන් අයවිය යුතු රු.211,130 ක වටිනාකමකින් යුත් දේපළ ණය ශේෂය වර්ෂ 18 කට ආසන්න කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රියදුරුවරයකුගෙන් අයවීමට තිබූ ආපදා, උත්සව හා පාපැදි ණය වටිනාකම් පිළිවෙලින් රු.145,568 , රු.7,500 , රු.1,200 ලෙස එකතුව රු.154,268 ක වටිනාකම විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට නියමිත බව දැන්වුවද එසේ අයකර ගැනීමට කටයුතු කර නොමැතිව විශ්‍රාම පාරිතෝෂිත මුදල නිදහස් කර තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක විශ්‍රාම ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,204,217 ක ණය ශේෂයන් 2022 දෙසැම්බර් 31 දින වන විට වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වැඩ තහනමට ලක් වී ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් එකතුව රු.303,888 ක ණය ශේෂයක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අය නොවී පැවතුණි. මෙම ණය ශේෂ වර්ෂ 04 සිට වර්ෂ 11 ක පමණ කාලයක් තුළ අයකර ගැනීමට හෝ ණය ශේෂ ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් එකතුව රු.264,809 ක ශේෂයක් 2022 දෙසැම්බර් 31 දින වන විට අය නොවී පැවතුණ අතර, මෙයින් රු.254,640 ක මුදලක් වර්ෂ 09 සිට වර්ෂ 21 පමණ කාලයක් තුළ අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.7 අමාත්‍ය මණ්ඩල තීරණවලින් බැහැරවීම

2022 මහ කන්නය සඳහා පරිසර හිතකාමී පොහොරවල මිල ගණන් සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් 2022 නොවැම්බර් 01 දිනැති අංක OF/79/2022 සංදේශය මඟින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර තිබූ අතර, එයට අදාලව මුදල්, ආර්ථික ස්ථායීකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ 2022 නොවැම්බර් 17 දිනැති අංක.DF/D/CO/2022-19 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාලව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ අංක 1 අනුව සැපයුම්කරුවන් සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශ මත ගෙවීම්, අමාත්‍යාංශ මට්ටමින් සිදුකළ යුතු බව දක්වා තිබුණි. ඒ අනුව 2022 නොවැම්බර් 21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1745/612/013-1 හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණ

(II) (ඇ) අනුව, ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා තෝරාගත් පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් විසින් සපයනු ලබන පොහොර සඳහා වන ගෙවීම්, අදාල දිස්ත්‍රික් ලේකම් / දිසාපතිගේ නිර්දේශ මත කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නිරවුල් කිරීමට හැකිවන පරිදි යෝග්‍ය වැඩපිළිවෙලක් හඳුන්වාදීම මඟින් සිදුවිය යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ඔක්තෝබර් 10 දිනැති අංක.SMA/ACC/11/Fertilizer දරන ලිපිය මඟින් ගෙවීම් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත රු.823,481,050 ක මුදලක් ලබාදී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ගෙවීම් කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදුකළ යුතු වුවද, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් 12 දෙනෙකු වෙත රු.205,000,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. එසේම කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් 2023 මාර්තු 29 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාලව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මෙම ගෙවීම් කිරීම සඳහා 2023 අප්‍රේල් 26 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද, ඉහත මුදල ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාදී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 දැක්ම හා මෙහෙවර

සංවර්ධන කටයුතු සඳහා වෙන් වන ප්‍රතිපාදන මුදල් වර්ෂයේ අවසන් දිනට පෙර සියයට සියයක් ප්‍රයෝජනයට ගැනීම අරමුණක් වුවද, ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ රු.7,687,600,639 ක ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 30,786 ක් ඉටුකිරීමට ඇස්තමේන්තු කර තිබුණද ක්‍රියාත්මක කර තිබුණේ රු.359,842,202 ක් වටිනා ව්‍යාපෘති 1,787 ක් පමණි.

#### 3.1.2 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක.02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම තුළ ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල දක්වා නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 03 ඡේදය (ආ) පරිදි එම සැලැස්ම වාර්ෂික අයවැය ඇස්තමේන්තු පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්මක් විය යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

### 3.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබිය යුතු අතර, ආයතනයේ ප්‍රධාන කාර්යයන් අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දක්වා තිබුණද ආයතනයේ 5,606 ක් වන මුළු කාර්ය මණ්ඩලයෙන් 2,730 ක් සඳහා පමණක් පුහුණු වැඩසටහන් පවත්වා තිබුණි.

### 3.1.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් 2022 වර්ෂය තුළදී එක් එක් අංශ මඟින් වැඩසටහන් 06 ක් පැවැත්වීම සඳහා අපේක්ෂිත වැඩසටහන් 817 ක් සැලසුම් කර තිබූ අතර, ඒ සඳහා රු.4,549,760 ක මුදලක් වෙන්කර තිබුණද, එම අංශයේ සේවක සංඛ්‍යාව 83 දෙනෙකු විසින් වර්ෂය තුළදී ඉටුකරනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව 449 ක් වූ අතර, ඒ සඳහා වැයකරන ලද මුදල එකතුව රු.2,784,178 ක් විය. ඒ අනුව එම අංශයේ වාර්ෂික ප්‍රගතිය සියයට 54 ක මට්ටමක පැවතුණි.

(ආ) ප්‍රවෘත්ති අංශය විසින් දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අදාළ කටයුතු ප්‍රචාරණය සඳහා ප්‍රදේශයේ මාධ්‍යවේදීන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වැඩසටහනක් සඳහා රු.100,000 ක මුදලක් වෙන්කර තිබුණද, නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත මෙම අංශයෙන් එම වැඩසටහනද වර්ෂය තුළ පවත්වා නොතිබුණි.

(ඇ) ආපදා කළමනාකරණ අංශයට අනුයුක්ත කර ඇති නිලධාරීන් 10 දෙනෙකු විසින් 2022 වර්ෂය තුළදී දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පෙර සූදානම් හා සැලසුම්, ආපදා අවම කිරීමේ වැඩසටහන් සහ හදිසි ආපදා කටයුතු සඳහා වැඩසටහන් 126 ක් ඉටු කිරීම සඳහා රු.48,756,474 ක මුදලක් වැය කිරීමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුළ වැඩසටහන් 23 ක් පමණක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.359,955 ක මුදලක් වැයකර තිබූ බැවින්, එම අංශයේ වැඩසටහන්වල ප්‍රගතිය සියයට 18 ක අවම මට්ටමක පැවතුණි.

(ඇ) ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී කාබනික පොහොර නිෂ්පාදන බලපත්‍ර ලබාදීම, පොහොර තොග තත්ත්ව පරීක්ෂාව, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්, ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පොහොර නියැදි ලබා ගැනීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම්, පොහොර කමිටු රැස්වීම් හා සංග්‍රහ වියදම් වැනි වැඩසටහන් 338 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,305,000 ක මුදලක් වැය කිරීමට සැලසුම් කර තිබුණද, නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමන්විත මෙම අංශය විසින් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණේ වැඩසටහන් 67 කි. ඒ සඳහා රු.61,182 ක මුදලක් වැය කර තිබීමෙන් වැඩසටහන්වල ප්‍රගතිය සියයට 20 ක අවම මට්ටමක පැවතුණි.

(ඉ) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිත්තවැල්ල ග්‍රාම නිලධාරී වසමේ සි/ස තිත්තවැල්ල මැටි කාර්මික ග්‍රාමීය කර්මාන්ත සමිතිය වෙත කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් 2009 වර්ෂයේදී රු.866,759 ක් වටිනා උපකරණ ලබාදී තිබුණ අතර, 2021 වර්ෂයේදී වේවැල්, පිත්තල, මැටි, ලී බඩු, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.4,698,456 ක ඉදිකිරීම් සිදුකර තිබුණි. 2022 වර්ෂයේදීද කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපාදන යටතේ රු.1,073,552 ක අලුත්වැඩියාවන් සිදුකර ඇතත්, මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩමේ අයිතිය තහවුරු කර නොතිබුණි. මධ්‍යස්ථානය සතු උපකරණ ප්‍රතිලාභීන් පොදුවේ භාවිතා කිරීමක් නිරීක්ෂණය නොවුණ අතර, නිෂ්පාදන කටයුතු හා උපකරණ එක් පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. එසේම ලබාදී තිබූ රු.497,224 ක උපකරණ වර්ෂ ගණනාවක සිට භාවිතයට නොගෙන නිෂ්කර්යව පැවතුණ අතර, ප්‍රතිලාභීන්ට පෞද්ගලිකව ලබාදී තිබූ මැටි ඇඹරුම් යන්ත්‍රවල විවිධ දෝෂ හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණි.

(ඊ) ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව රු.6,947,091 ක ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබූ ග්‍රාමීය වොලිබෝල් ක්‍රීඩාංගන 04 ක් භාවිතයට නොගෙන නඩත්තුවකින් හා භාවිතයකින් තොරව වල් බිහිවී නිෂ්කාර්යව පැවතුණි.

(උ) ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ හණ වගා ව්‍යාපෘතියක් සඳහා රු.940,760 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ අතර, රු.581,250 ක වටිනාකමකට හණ පැල 12,500 ක් සිටුවීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද, ආයතනයේ නිලධාරීන් විසින් හණ පැල 20,000 ක් සිටවා ඇති බවට ව්‍යාජ තොරතුරු වාර්තා ඉදිරිපත් කර තිබුණු අතර, භෞතිකව පරීක්ෂා කිරීමේදී හණ පැල අදාල ප්‍රමාණය සිටුවා නොතිබුණි.

(උ) රු.මිලියන 03 ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.4,792,975,739 ක ප්‍රතිපාදන මත ව්‍යාපෘති 16,146 ක් අනුමත වුවද, එයින් සියයට 05 ක් වන රු.256,893,522 ක් වන ව්‍යාපෘති 1,100 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණ අතර, ව්‍යාපෘති 15,046 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ) රු.මිලියන 04 පළාත් පාලන කොට්ඨාශ සංවර්ධන වැඩසටහන යටතේ රු.1,432,825,000 ක් වටිනා ව්‍යාපෘති 6,629 ක් අනුමත වී තිබුණද, ක්‍රියාත්මක කර තිබුණේ එයින් සියයට 03 ක් පමණ වන රු.41,588,535 ක් වන ව්‍යාපෘති 259 ක් වන අතර, ව්‍යාපෘති 6,370 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඒ) රු.මිලියන 20 ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.343,067,000 ක් වටිනා ව්‍යාපෘති 1,809 ක් අනුමත වී තිබුණද, ක්‍රියාත්මක කර තිබුණේ එයින් සියයට 05 ක් පමණ වන රු.16,457,299 ක් වටිනා ව්‍යාපෘති 112 ක් වන අතර, ව්‍යාපෘති 1,697 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඔ) රු.මිලියන 100 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ රු.1,118,732,900 ක් වටිනා ව්‍යාපෘති 6,202 ක් අනුමත වුවද, ක්‍රියාත්මක කර තිබුණේ එයින් සියයට 04 ක් වන ව්‍යාපෘති 316 ක් පමණක් වන අතර, ව්‍යාපෘති 5,886 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.1.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2017,2018,2019 වර්ෂවල අදියර I යටතේ රු.178,789,500 ක මුදලක්ද, 2022 දෙසැම්බර් 31 දින වන විට අදියර II යටතේ රු.62,680,000 ක මුදලක්ද වශයෙන් එකතුව රු.241,469,500 ක මුදලක් ප්‍රතිපාදන වශයෙන් ලබාදී තිබුණි. මෙම ව්‍යාපාරයේ අරමුණ 2020 වන විට ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ග්‍රාම නිලධාරී වසම් 5,000 ක් ඇති කිරීම තුළින් එකී ග්‍රාමයන් තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම විය. ඒ අනුව ජනතාවගේ මාසික ආදායම දෙගුණ කිරීම මෙම වැඩසටහනේ අරමුණක් වුවද, එය ඉටුවී නොතිබුණු අතර, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අදියර I යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක් තුළ ග්‍රාම ශක්ති සමිති 90 ක්ද, අදියර II යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් තුළ ග්‍රාම ශක්ති සමිති 160 ක්ද වශයෙන් එකතුව ග්‍රාම ශක්ති සමිති 250 ක් වෙත ලබාදුන් රු.241,469,500 ක මුදලින් 2022 දෙසැම්බර් 31 වන විට රු.109,094,352 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බරම්පොල වසමේ එකමුතු ග්‍රාම සංවර්ධන සමිතියේ මාතෘ හා ළමා සායනය සඳහා වැසිකිලියක් ඉදිකිරීම වෙනුවෙන් රු.247,238, ක් වැයකර තිබුණු නමුත් මෙම ස්ථානයේ ළමා බර කිරීම් කටයුතු පමණක් ඉටු කරන අතර මාතෘ සායනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙලගෙදර ඔසු උයනට ජල සම්බන්ධතාවය ලබා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය ජලනල හා උපාංග සපයා සවි කිරීමට එකතුව රු.191,444 ක් වැයකර අදාල ව්‍යාපෘතිය නිම කර තිබුණද, ජල පහසුකම් ලබාදී නොතිබූ බැවින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොතාන ග්‍රාම නිලධාරී වසමේ කිරි හා එළවළු, පළතුරු නිෂ්පාදන ගම්මානයක් වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා රු.4,465,465 ක වියදමක් දරා කිරිගවයින්, ගව ගාල් ජල සම්පාදන උපකරණ හා පළතුරු පැල ලබාදී තිබුණද, ගව ගාල් බොහොමයක් ඌණ උපයෝජිත තත්ත්වයේ තිබූ අතර, ලබාදී තිබූ පළතුරු පැල බොහෝ ප්‍රමාණයක් විනාශ වී තිබූ අතර, ඉතිරි පැල අස්වනු ලබාගත නොහැකි තත්ත්වයේ පැවතුණි.

(ඉ) ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩදොඹේ වසමේ රු.4,875,000 ක වියදමක් දරා සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ කිලෝපේර හා වැල්දොඩම් ඒකාබද්ධ වගාවක් ක්‍රියාත්මක කර තිබුණ අතර, ලබා දී තිබූ පැල බොහොමයක් මිය යාම හේතුවෙන් ද, නිසි පුහුණුවක් ලබා නොදීම තුළින් අස්වනු නොමැතිවීම හේතුවෙන්ද, ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා රු.1,000,000ක වියදමින් ප්‍රතිලාභීන් 30 දෙනෙකු ඉලක්ක කර ඉදිකර තිබූ වගා ළිඳ ප්‍රතිලාභීන් 03 දෙනකු පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ඊ) පඬුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සඳහා ග්‍රාම නිලධාරී වසම් 03 කට අදාලව රු.4,988,176 ක වියදමින් වේවැල්, තල කොළ ආශ්‍රිත නිෂ්පාදනයන් හා මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන වශයෙන් ගම්මාන 03 ක් පිහිටුවා තිබුණ අතර, විවිධ ගැටලු හේතුවෙන් නිෂ්පාදන කටයුතු ප්‍රශස්ත මට්ටමකින් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, ලබාදී තිබුණ බොහෝ උපකරණ ඌණ උපයෝජිත තත්ත්වයේ පැවතුණි.

(උ) මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ඉදුල්ගොඩකන්ද ග්‍රාම නිලධාරී වසමේ කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන සඳහා මිලදී ගන්නා ලද රු.95,000 ක් වටිනා සුදු ගම්මිරිස් යන්ත්‍රය හා රු.850,000 ක් වටිනා විජලන යන්ත්‍රය ඌණ උපයෝජිත තත්ත්වයේ පැවතුණි.

(ඌ) වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.3,474,096 ක වියදමින් ඇඟළුම් නිෂ්පාදන පොකුරු ගම්මාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණද, එය නිෂ්පාදන ගම්මාන සංකල්පයෙන් බැහැරව ස්වයං රැකියා ප්‍රවර්ධන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වී තිබුණි. එසේම ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක කළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ඉදි කරන ලද රු.2,929,178 ක ප්‍රවේශ මාර්ග වැඩසටහනේ ප්‍රතිලාභීන් ඉලක්ක කර සිදුකළ ව්‍යාපෘතියක් නොවුණි.

(එ) රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ වසම් දෙකක් කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් හා සුළු අපනයන බෝග නිෂ්පාදන ගම්මානයක් වශයෙන් සංවර්ධනය කර තිබුණද, කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය සඳහා ලබාදී තිබුණ රු.1,478,519 ක් වටිනා කොහු නිෂ්පාදන යන්ත්‍රය, ලණු අඹරණ යන්ත්‍රය, ලණු බෝල කිරීමේ යන්ත්‍රය ආදී යන්ත්‍ර ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් කොහු නොමැති වීම හේතුවෙන් භාවිතයට නොගෙන ඌන උපයෝජිත තත්වයේ පැවතුණි.

(ඒ) රන්තැටිකන්ද සුළු අපනයන බෝග ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා , රු.944,297 ක වියදමින් ඉදිකළ ගොඩනැගිල්ල සඳහා විදුලි පහසුකම් ලබාදී නොතිබීම මධ්‍යස්ථානය දක්වා ගමන් කිරීමට ඇති මාර්ග දුෂ්කරතාවයන් හේතුවෙන් මෙම මධ්‍යස්ථානය සඳහා ලබාදී තිබුණු රු.1,595,000 ක් වටිනා වියළීමේ යන්ත්‍රය හා රු.175,000 ක් වටිනා බීජ වෙන් කිරීමේ යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. එසේම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී මෙම තත්ත්වයන් සම්බන්ධ අවධානය යොමු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(ඔ) බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ඌරාපොත්ත ග්‍රාම නිලධාරී වසමේ මැටි කර්මාන්ත නිෂ්පාදන ගම්මානයක් ලෙස රු.6,497,240 ක් වැයකර සංවර්ධනය කර තිබුණද, ලබාදී තිබූ මැටි සකස් කිරීමේ මඩු බොහොමයක් භාවිතයට ගෙන නොතිබුණු අතර, විවිධ ගැටලු හේතුවෙන් නිෂ්පාදන කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදුවී නොතිබුණි.

(ඕ) අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ බෙදාදුන් පැෂන් පැල 200 කින් සියයට 90 ක ප්‍රතිශතයක් වූ පැල 180 ක් පමණ විනාශ වී තිබුණි.

(ක) කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ නාවාන ග්‍රාම නිලධාරී වසම සම්ප්‍රදායික වඩු කර්මාන්ත ගම්මානයක් වශයෙන් වැඩිදියුණු කිරීමට තෝරාගෙන තිබීම හේතුවෙන් මේ සඳහා රු.1,875,000 ක රජයේ දායකත්වයක් යටතේ භාණ්ඩ හා උපකරණ ලබාදී තිබුණු නමුත් ප්‍රතිලාභීන් වෙත පෞද්ගලික වනසේ අදාල භාණ්ඩ ලබාදී තිබීම හේතුවෙන් අපේක්ෂිත නිෂ්පාදන ගම්මාන සංකල්පය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ග) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ නයි කොච්චි වගා කිරීම සඳහා රු.5,062,500 ක් වැයකර තිබුණද, පොහොර හා පළිබෝධ නාශක සපයා ගැනීමේ ගැටලු හේතුවෙන් පළමුවර වගාවෙන් පසු නැවත වගාවක් සඳහා දිගින් දිගටම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(ව) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ මිංහෙට්ටිය වසමේ බිත්තර වී නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියක් සඳහා රු.7,813,495 ක වියදම් දරා විවිධ උපකරණ ලබාදී තිබූ අතර මෙම උපකරණ භාවිතයට ගෙන තිබුණද, සාමාන්‍ය වී නිෂ්පාදනය හැර අපේක්ෂිත පරිදි බිත්තර වී නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි.

(ජ) වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.3,800,000 ක වියදමින් වදුරුස්ස, වැල්ගාල වසමේ ඇඟලුම් උප කොටස් මසා නිම කර දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණ අතර, ප්‍රතිලාභීන් බහුතරයකට නිෂ්පාදන කටයුතු හා තාක්ෂණ භාවිතය පිළිබඳ පුහුණු හැකියාව අවම මට්ටමක පැවතීම, තෝරාගත් ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම හා ප්‍රතිලාභීන් එකිනෙකා දුරින් සිටීම, ප්‍රවේශ මාර්ග නොමැති වීම වැනි හේතූන් නිසා ප්‍රමාණවත් නිෂ්පාදනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ට) උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ කැකුණාවල වසමේ කුකුළු පාලන හා බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.4,831,841 ක් වැයකර දිනක් වයසැති කුකුළු පැටවුන් බෙදාදී තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගන්නා ලද ප්‍රතිලාභීන්ට කුකුළු කෑම හා බෙහෙත් සඳහා විශාල පිරිවැයක් දැරීමට අපහසුවීම මත කුකුළු පැටවුන් විශාල ප්‍රමාණයක් මියගොස් සිටි අතර, නැවත පැටවුන් යෙදීමටද ප්‍රතිලාභීන් අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(ඩ) රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බටුගහකොටුව කෘෂි මාර්ගය ඉදිකිරීම සඳහා රු.218,225 ක් වැයකර තිබුණද, මාර්ගය කැලෑවෙන් වැසී තිබුණු අතර, මාර්ගය භාවිතයට ගෙන නොතිබුණි.

(ත) 2021 වර්ෂයේ සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක ප්‍රතිලාභීන් 38 දෙනෙකු වෙත රු.1,611,287 ක භාණ්ඩ හා උපකරණ ලබාදී තිබුණ අතර, එම ප්‍රතිලාභීන් වෙතම රු.1,119,888 ක වියදමින් පසුගිය වර්ෂවලදීද විවිධ භාණ්ඩ ලබාදී ඇතත් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය වීමක් හෝ උසස්වීමක් සිදුවී ඇතිද යන්න පසුවිපරමකින් තොරව පසුගිය වර්ෂයන්හිදී ලබාදී ඇති ව්‍යාපෘති සඳහාම අවශ්‍ය වන භාණ්ඩ 2021 වර්ෂයේදීද ලබා දී තිබුණි.

(ද) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 28 දෙනෙකු වෙත ජීවනෝපාය ව්‍යාපෘතිය යටතේ 2015 – 2018 වර්ෂවල රු.513,765 ක වටිනාකමින් යුතු විවිධ උපකරණ ලබාදී තිබුණු අතර, 2021 වර්ෂයේදී එම ප්‍රතිලාභීන්ටම රු.1,006,197 ක් වටිනා උපකරණ ලබාදීමෙන් අදාල ප්‍රතිලාභීන් කිසිදු කර්මාන්තයක දීර්ඝකාලීනව නොයෙදෙනා බව තහවුරු වී තිබූ අතර 2021 වර්ෂයේදීත් ප්‍රතිලාභ ලැබිය යුතු වෙනත් පාර්ශවයන් වෙත ප්‍රතිලාභ ලැබීම සීමා වී තිබුණි.

(න) ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් සවි බල ගැන්වීමේ ව්‍යාපෘති යටතේ රු.457,470 ක් වටිනා කුකුළු පැටවුන් 1,291 ක් මිලදී ගෙන ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණද ඵලදායී ලෙස රාජ්‍ය මුදල් භාවිත කිරීම කෙරෙහි අවධානය යොමු නොවීම හේතුවෙන් නියැදි විගණන පරීක්ෂාව අනුව ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ කුකුළු පැටවු 241 කින් පැටවු 240 ක්ම මියගෙස් තිබුණි.

### 3.1.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සුධිරගම ප්‍රජාශාලා භූමියේ සෝදාපාලුව වැලැක්වීම සඳහා වැට සහ බැම්ම ඉදිකිරීම වෙනුවෙන් රු.388,000 ක මුදලකට ගිවිසුම්ගතව රු.229,436 ක වටිනාකමකට වැඩ නිමකර තිබුණද, ප්‍රතිලාභීන් විසින් වැට කණු සකස් කර දැල් වැට ගසා වැඩ නිම කර ගොඩනැගිල්ලේ ආරක්ෂාව සලසාගෙන නොතිබුණි.

(ආ) රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය විසින් කෝරලයාගම සේවා පියස ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා රු.1,164,000 ක මුදලකට ඇස්තමේන්තුගතව රු.652,450 ක වැඩ නිමකර සේවා පියස ගොඩනැගිල්ලේ කුළුණු පමණක් ඉදිකර වැඩ නවතා දමා තිබුණි.

(ඇ) කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාලගමුව එක්සත් අවමංගල්‍යාධාර සමිති ශාලාව රු.194,000 ක මුදලක් වැයකර කුළුණු පමණක් ඉදිකර තිබුණ අතර, වැඩ නවතා දමා තිබුණි.

(ඈ) කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අයත් මොන්නෑකුලම සේවා පියස කාර්යාලයට ඒකාබද්ධව තැපැල් කාර්යාලය හා සමූපකාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහාරු.1,000,000 ක ඇස්තමේන්තුවක් යටතේ රු.970,000 ක් වැයකර ඉදිකිරීම් කටයුතු කොන්ක්‍රීට් කළුණු සකස් කිරීමට පමණක් සීමා වී තිබූ අතර මෙම ඉදිකිරීම් කටයුතු අවසන් වී වසරක් පමණ ගතවී තිබුණ ද ගොඩනැගිල්ල හා අවට භූමිය කැලෑවෙන් වැසී කොන්ක්‍රීට් කුළුණු සඳහා යොදා ඇති කම්බි මලකඩ සහිතව දිරායාමට ලක්වෙමින් තිබුණි.

### 3.1.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 වර්ෂයේ ක්‍රීඩා පාසැල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ තරුණ කටයුතු ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.20,382,595 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා දී තිබූ අතර, මෙම මුදලින් රු.19,186,942 ක වියදමක් දරා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය බොරළු දමා තැලීම පමණක් සිදුකර ඇති බැවින්, මෙම ක්‍රීඩාපිටිය සිසුන්ට භාවිතා කළ නොහැකි මට්ටමේ පැවතීම හේතුවෙන් සහ එසේම ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතිය අතර මග නතර වීම හේතුවෙන් ක්‍රීඩා පාසැලක් වන විද්‍යාලයේ ක්‍රීඩා කටයුතු මේ වන විටත් අඩපන වී තිබුණි.

(ආ) ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නීරාලියද්ද වොලිබෝල් ක්‍රීඩාංගනය රු.1,500,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් යටතේ ඉදිකර ඇතත්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ක්‍රීඩාංගනය වටා දැල් ගැසීමක් සිදුකර නොතිබුණ අතර, පරීක්ෂා කරන අවස්ථාව වන විටත් ක්‍රීඩා කටයුතු සඳහා යොදා නොගෙන ක්‍රීඩාංගනය ඇතුළත මඤ්ඤොක්කා වගා කර තිබුණි.

(ඇ) ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක රු.1,939,350 ක වටිනාකමින් යුතුව මුං බෝගය වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබූ අතර වර්ෂය අවසානය වන විට වගා අපේක්ෂාව වූ අක්කර 231 කින් සියයට 26 ක් වන අක්කර 60 ක පමණ භූමි ප්‍රමාණයක් වගා හානි ලක්වීම හා වගාවට භාවිතා කිරීම නොකිරීම හේතුවෙන් අපේක්ෂිත අස්වැන්න වූ මුං බීජ කි.ග්‍රෑ.82,720 කින් සියයට 25 ක් පමණ වන බීජ කි.ග්‍රෑ.21,009 ක පමණ අස්වැන්නක් ලැබී තිබුණි.

### 3.1.8 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර තිබුණද, වාර්තාවේ 4 ඡේදයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව සංරචක 13 ක් යටතේ දක්වා ඇතත්, ක්‍රියාකාරී සැලැස්ම තුළ එවැනි සංරචක කිසිවක් දක්වා නොතිබුණු අතර, ග්‍රාමීය විදුලිය, ක්‍රීඩා පිටි, සුළු වාරිමාර්ග, සූර්ය පැනල ග්‍රාමීය ජල සැපයුම් හා නිල සෙවන යන ව්‍යාපෘති සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නොතිබුණි.

(ආ) ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, සනීපාරක්ෂක පහසුකම් හා ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය යන සංරචක දෙකෙහි සත්‍ය නිමවුම් මට්ටම සියයට 49 ට අඩු මට්ටමේ පැවති අතර, මෙම සංරචක ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබුණි.

(ඇ) සතිපොල හා අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය, සමාජ සුභසාධනය හා වෙනත් යන සංරචක තුනෙහි නිමි ප්‍රතිශතය සියයට 50-74 අතරද, ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා සියයට 90-100 ත් අතර පැවතුණද, මෙම සංරචක කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවීම හා කාර්යසාධන දර්ශක නිමි ප්‍රතිශතය පිළියෙල කිරීම සඳහා නිමි ව්‍යාපෘති සංඛ්‍යාව කොතෙක්ද යන්න දක්වා නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උඩුබද්දාව, කුලියාපිටිය (නැගෙනහිර), මාස්පොත, මල්ලවපිටිය, පඩුවස්නුවර (නැගෙනහිර), ගල්ගමුව හා රස්නායකපුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හි කාර්යාල ආරම්භ කර වර්ෂ 14 සිට වර්ෂ 59 දක්වා කාලයක් ඉක්ම ගොස් ඇතත්, එම කාර්යාල පිහිටි ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජයන්තිපුර ග්‍රාම නිලධාරී වසමේ රාජංගනය යාය 04 හි පිහිටි කලාඔය දූපතේ හෙක්ටයාර 49.6122 ක ඉඩමෙන් (අක්කර 124.0305) කොටසක් අනවසර පදිංචිකරුවන් 07 දෙනෙකු විසින් සහ ස්වාමීන් වහන්සේ නමක් විසින් අනවසරයෙන් අල්ලාගෙන භුක්ති විඳිමින් තිබූ අතර, එසේම මෙම ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ රක්ෂිත භූමියක් ලෙස නම් කිරීමට තීරණය කිරීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර වසරකට වැඩි කාලයක් ගතවී ඇතත්, එමඟින්ද නිශ්චිත විසඳුමක් ලැබී නොතිබුණි.

(ඇ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනය ලෙස භාවිතා කරන ලද අංක 52-6128 දරන කැබ් රථය 2013 නොවැම්බර් 27 දින සිට ධාවනයෙන් ඉවත්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගාල් කර තිබුණ අතර, 2014 මැයි 29 දින කුරුණෑගල දිස්ත්‍රික් ප්‍රධාන මෝටර් රථ පරීක්ෂක විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන රථය පනගන්වා පරීක්ෂණ කටයුතු කළ යුතු බව දක්වා තිබුණද, 2023 පෙබරවාරි මස වන විටත්, මෙම රථය අලුත්වැඩියා කර ධාවනයට ගැනීමට, අපහරණය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂ 09 කට අධික කාලයක සිට මෙම වාහනය විනාශ වී යාමට ලක්ව තිබුණි.

(ඈ) උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 52-5707 දරන රථයේ 2011 මැයි 20 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් වූ අලාභ හානිය රු.114,650 ක් ලෙස හඳුනාගෙන තිබුණ අතර, අනතුර සිදුවී වර්ෂ 12 ක් ගත වී ඇතත්, අදාල පාර්ශවවලින් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, එම අනතුරෙන් පසු රථය අලුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සඳගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාතෘ සායනය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.1,150,000 ක මුදලින් සකස් කර එයට ලබාදී තිබුණු පුටු ඇතුළු උපකරණද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අදාල මාතෘ සායනය අත්හැර දමා තිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අයත් ගොඩනැගිලි 71 ක් හා ඊට අයත් ඉඩම් කොටස් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(උ) මාවතගම ප්‍රාදේශීය ලේකම්වරයා විශ්‍රාම යන අවස්ථාවේදී ගබඩා භාණ්ඩ ආපසු භාරදෙන විට ලබාදී තිබූ ටැබ්ලට් පරිගණකය වෙනුවට පාවිච්චියට ගත නොහැකි වෙනත් පරිගණකයක් ලබාදී ඇති බව තාක්ෂණික වාර්තා මඟින් තහවුරු වී ඇතත් නියමිත ටැබ්ලට් පරිගණක යන්ත්‍රය නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොක්මඩුව හා ඔරුගල ග්‍රාම නිලධාරී වසම්වල රාජාංගනය ජලාශයට අයත් ජල පෝෂිත ප්‍රදේශයේ පුද්ගලයන් 65 දෙනෙකු අනවසරයෙන් පදිංචි වී සිටින අතර, මැනුම් කටයුතු කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ කටයුතු කිරීමේ ප්‍රමාදයක් පැවතුණි.

(ඓ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති කුරුණෑගල නාගරික සීමාව තුළ පිහිටි රජය සතු ඉතා වටිනකමැති දේපළ 26 ක් කුරුණෑගල මහ නගර සභාවට පවරාදෙන ලෙස ඉල්ලා තිබූ අතර, ඒවා විධිමත් පරිදි පැවරීමක් සිදුකර නොතිබුණි. එසේම මෙම දේපළවලින් බොහෝමයක් වාණිජ පරමාර්ථයෙන් පවරා ගැනීම සඳහා ඉල්ලා තිබූ අතර, මේවා දිගු කාලීන බදු පදනම මත ලබාදී රජයට ආදායමක් උපයාගත හැකිව තිබියදී, මේ සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකර නොතිබුණි.

(ඔ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හකුරුකැටියාව කටුවාවෙවත්ත නමැති පර්වස් 109.77 ක රජයේ ඉඩමේ වසර ගණනාවක සිට පවුල් 17 ක් අනවසරව පදිංචි වී ඔවුන් විසින් අනවසර ඉදිකිරීම්ද සිදුකර ඇතත්, විගණන දින වන විටත් මේ සම්බනධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 දරන චක්‍රලේඛ උපදෙස් පරිදි, මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම, භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් 612 වැනි අධිකාරිය මත රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, වීරඹුගෙදර, මාස්පොත, මල්ලවපිටිය, ඇහැටුවැව හා රිදීගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නිලධාරීන් 11 දෙනෙක් විසින් රු.55,500 ක් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක නිලධාරීන් 41 දෙනෙකු විසින් රු.152,455 ක් අඩුවෙන් ඇප මුදල් තැන්පත් කර තිබුණි.

### 3.4 මුල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරිණියක වෙත 2019 මාර්තු 19 සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව අතිරේක පාරිශ්‍රමිකයක් ලෙස රු.66,146 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. මාස 05 ක කාලයක් තුළ අවස්ථා 05 කදී එයින් රු.56,706 ක මුදලක් අයකර ගෙන ඇතත්, ඉතිරි රු.9440 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ගම පත්තුව කෝරලේ 1201-වැදණ්ඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දික්වැහැර ග්‍රාමයේ අංක 47/19/1 මු.පි.කු 1326 දරන පිඹුරෙහි අංක 54 දරන කොස් කැලය නමැති බිම් කැබැල්ල ප්‍රදාන පත්‍ර හිමිකරු විසින් පෞද්ගලික සන්නිවේදන කුළුණක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී සමාගමක් වෙත ලබාදී තිබුණ බැවින්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2018 ජූලි 16 දිනැති අංක 2007/3(iii) චක්‍රලේඛය ප්‍රකාරව අදාල කොටස නැවත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරාගෙන නොතිබීම හේතුවෙන් රු.1,015,000 ක ගණනය කළ අලාභයක් රජයට සිදුවී තිබුණි.

(ආ) මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් PD-9477 කැබ් රථයට 2018 වර්ෂයේදී සිදුවූ අනතුරක් හේතුවෙන් අයවිය යුතු රු.27,709 ක මුදල අනතුර සිදුවී වර්ෂ 05 ක් පමණ ගත වී ඇතත්, වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.6 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බහුකාර්ය සංවර්ධන සහායකයින් නිත්‍ය පදනම මත ඒ ඒ ස්ථානවලට අනුයුක්ත කළ යුතු වුවද, පඬුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සංවර්ධන සහායිකාවන් ඔවුන් අනුයුක්ත කළ ස්ථාන 03 ක සේවයට වාර්තා කිරීම ප්‍රතික්ෂේප කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැඳී සිටීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එකතුව රු.810,000 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2020 දෙසැම්බර් 21 දිනැති අංක.WDM/SEVI/17/3 දරන ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රවල ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් ලබාගැනීම සඳහා දැනට ක්‍රියාත්මක බහුකාර්ය සංවර්ධන සහායකයින් ඉදිරියේදී යෙදවීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණද, රිදීගම, ඇහැටුවැව, පඬුවස්නුවර (නැගෙනහිර) හා කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිත්‍ය පදනම මත අනුයුක්ත කර තිබූ සහායකයින් 40 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයන් ඉටුකරවා නොගෙන දීමනා වශයෙන් රු.10,800,000 ක මුදලක් ගෙවා තිබුණ මෙම සහායකයින් උක්ත කාර්යයන් සඳහා යෙදවාගත හැකිව තිබියදීත්, පෞද්ගලික ආයතන වෙත රු.4,820,993 ක මුදලක් එම සේවාවන් ඉටුකිරීම වෙනුවෙන් ගෙවා තිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාම ශක්ති ව්‍යාපාරය යටතේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ අදියර I සහ II ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කළ මුදල රු.52,434,455 ක් වූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට වියදම් කර ඇති මුදල රු.15,507,338 ක් විය. ඒ අනුව මුදලින් ඉතිරිය රු.36,927,117 ක් වීමෙන් ග්‍රාම සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම අවම මට්ටමක පැවතුණි.

(ආ) ධාරිතා සංවර්ධනය වෙනුවෙන් ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම හැකියාවන් ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට රු.10,429,432 ක් මුදලක් වෙන්කර තිබූ නමුත් වැයකර තිබුණේ රු.792,510 ක මුදලක් විය. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් ධාරිතා සංවර්ධනය සඳහා උපරිම ලෙස ප්‍රයෝජනයට නොගෙන රු.9,636,922 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) ධාරිතා සංවර්ධනය සඳහා අදියර II යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් තුළ ග්‍රාම නිලධාරී වසම් 46 ක ක්‍රියාත්මක කිරීම සඳහා රු.5,520,000 ක මුදල් වෙන්කර තිබුණද, එම මුදල් උපයෝජනය කොට මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අදියර I සහ II යටතේ පිළිවෙලින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ 30 ක් සහ 19 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.49,110,022 ක මුදලක් වෙන්කර තිබූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට වියදම් කර ඇති මුදල රු.39,816,190 ක් වූයෙන් ප්‍රතිපාදනයෙන් සියයට 19 ක් වූ රු.9,293,832 ක් ඉතිරි වී තිබුණි. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අදියර II යටතේ ග්‍රාම නිලධාරී වසම් 51 ක් සඳහා රු.4,553,600 ක මුදලක් වෙන්කර තිබුණද, 2022 දෙසැම්බර් 31 වන විටත් අදාල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) ජීවනෝපාය සංවර්ධනය යටතේ ව්‍යවසාය සංවර්ධන අරමුදල සඳහා වෙන්කළ මුදල රු.14,200,007 ක් වුවද, වියදම් කර තිබුණේ රු.3,529,382 ක් වූ බැවින්, ප්‍රයෝජනයට නොගෙන ප්‍රතිපාදනයෙන් සියයට 75 ක් රු.10,670,625 ක් ඉතිරි වී තිබුණි.

(ඊ) ව්‍යවසාය සංවර්ධනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක් තුළ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.7,405,015 ක මුදලක් වෙන්කර තිබුණද, කිසිදු ප්‍රයෝජනයකට නොගෙන එම මුදල ඉතිරිව පැවතුණි.

(උ) ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ අදියර I සහ II සඳහා වෙන්කළ මුදල රු.115,346,839 ක් වූ අතර, මෙයින් රු.68,517,082 ක් ණය වැඩසටහන් සඳහා වැයකර තිබූ අතර, ප්‍රතිපාදනයෙන් සියයට 41 ක් ඉතිරිය රු.46,829,757 ක් විය. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 74 ක් සඳහා රු.21,470,579 ක ණය මුදලක් ලබාදීම සඳහා වෙන්කර තිබුණද, අදාල ණය වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබූ ණය වැඩසටහනට අනුව, විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ක ක්‍රියාත්මක මෙම ණය වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ විෂයයට අදාල නිලධාරීන් නොමැතිකමින්ද ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල ගිණුම් අක්‍රිය වී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සඳහා ලබාදුන් රු.1,452,700 ක ණය වැඩසටහන් ක්‍රියාත්මක නොවන අතර, අදාල ගිණුම් අක්‍රිය වී තිබුණි.

(එ) අපේක්ෂා ණය වැඩසටහන යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා රු.1,000,000 ක මුදලක් ලබාදී තිබුණද, වගකිව යුතු නිලධාරියෙකු නොමැති බැවින් ණය යෝජනා ක්‍රමය අක්‍රිය වී තිබුණි.

(ඒ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක් තුළ 1990 සිට 2013 දක්වා ලබාදී තිබූ වක්‍රීය ණය වැඩසටහනට අදාල ශේෂය රු.8,272,000 ක් වුවද, එයින් එකතුව රු.7,222,300 ණය ශේෂයන් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර ඇතත්, එකතුව රු.1,049,700 ක ණය ශේෂයන් සනාථ කර ගැනීම සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඔ) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරිණියන් දෙදෙනෙකු 2018 ඔක්තෝබර් හා 2019 වර්ෂයේදී වැඩ තහනමට ලක් කර 2022 දෙසැම්බර් වන විට වර්ෂ 04 ක පමණ කාලයක් ඉක්ම ගොස් තිබුණද, අදාල පරීක්ෂණ නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඞ) මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක.MF/NPD/01/2021 දරන සහ 2021 ජනවාරි 11 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිදි 2021 විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රධාන අරමුණ ග්‍රාමීය සංවර්ධනය තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කර සාර්ව ආර්ථික ඉලක්කයන් සපුරා ගැනීම වුවද, චක්‍රලේඛයේ සඳහන් අපේක්ෂිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු නොකර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක ලියාපදිංචි සමිති හා ප්‍රජාමූල සංවිධාන සඳහා භාණ්ඩ හා උපකරණ සැපයීම කෙරෙහි ඉහළ ප්‍රමුඛතාවයක් දක්වා තිබූ අතර, මෙය මුළු විමධ්‍යගත ප්‍රතිපාදන වියදම වූ රු.88,241,505 න් රු.41,091,394 ක මුදලක් එනම් සියයට 47 ක ප්‍රතිශතයක් විය. ඒ අනුව ලියාපදිංචි සමිති හා ප්‍රජාමූල සංවිධාන සඳහා භාණ්ඩ හා උපකරණ ලබාදීම සඳහා දහම් පාසල් හා පන්සල් සංවර්ධනය, පෙර පාසල් සංවර්ධනය හා ලියාපදිංචි සමිති සඳහා භාණ්ඩ බෙදා දීම් වෙනුවෙන් රු.65,882,099 ක් එනම් සියයට 75 ක් වැයකර තිබුණි.

(ක) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින් / වැන්දඹුවන් 259 දෙනෙකු වෙත එකතුව රු.52,581,622 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර, 2022 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා එයින් තවදුරටත් රු.30,037,359 ක මුදලක් අය විය යුතුව තිබුණි.

(ග) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව වර්ෂ 01 සිට වර්ෂ 02 ½ අතර කාලය තුළදී වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල පත්කර ඇතත්, අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදුකර එකතුව රු.27,709 ක වටිනාකමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ච) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 කට අදාලව පසුගිය වර්ෂ 03 ක කාලපරිච්ඡේදය තුළ වන අලි හානි සඳහා එකතුව රු.10,574,971 ක් දේපළ, ශාරීරික හා ජීවිත හානි වශයෙන් වන්දි මුදල් පිරිනමා තිබුණද, පසුගිය කාලපරිච්ඡේදයට අදාලව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වන අලි ගැටලුවලට විසඳුම් ලබාගත හැකි සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ජ) රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා අංශයට අයත් ට්‍රැක්ටර් රථ 02 ක් හා ලොරි බවුසර් රථය සඳහා 2022 වර්ෂයට අදාලව වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ට) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ප්‍රතිලාභීන් 54 ක් සඳහා වර්ෂ 02 සිට 25 දක්වා කාලයක් රු.9,267,408 ක වටිනාකම් සමෘද්ධි සහනාධාර ඇතුළු අනෙකුත් සහනාධාර මඟින් ජීවනෝපාය සංවර්ධනය වී ඇති බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමෘද්ධි අංශය මඟින් හඳුනාගෙන ඇතත්, එම ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි සහනාධාරය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ප්‍රතිලාභීන් 10 ක් වෙත සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ලබාදී තිබූ රු.574,935 ක වටිනා උපකරණ භාවිතයට ගෙන කිසිදු ජීවනෝපාය සංවර්ධන කටයුත්තක නිරත නොවන බැවින් එම යන්ත්‍ර හා උපකරණ ආපසු ලබාගෙන සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබාදීමට හෝ රජයේ දායකත්වය අය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ත) ක්ෂේත්‍ර ගත රාජකාරිවල නිරත ක්ෂේත්‍ර නිලධාරීන් විසින් අදාල මාසයේ ඉදිරි වැඩසටහන ඊට පෙර මාසයේ 25 දිනට පෙර මාණ්ඩලික නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු අතර, ඒ ඒ මාසයේ කළ වැඩසටහන් ඊට පසු මාසයේ 05 වන දිනට පෙර මාණ්ඩලික නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව පවත්වා ගෙන යනු ලබන ලේඛන හා ඉදිරි/ කළ වැඩසටහන් ලිපිගොනුවලට අනුව නිලධාරීන් 34 දෙනෙකු මාස 01 - මාස 09 ක කාලයක් සඳහා ඉදිරි වැඩසටහන් ද, නිලධාරීන් 101 දෙනෙකු මාස 01 - මාස 07 ත් අතර කාලයක් සඳහා කළ වැඩසටහන්ද ඉදිරිපත් කර නොතිබුණු බැවින්, එම නිලධාරීන් වෙත ගමන් වියදම් ගෙවීම් කලේ කුමන පදනමකින්ද යන්න විගණනයේදී සනාථ නොවුණි.

## 4 තිරසාර සංවර්ධනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය මූල්‍ය ප්‍රමුඛතා අනුව සැලකූ මධ්‍යකාලීන සාර්ව මූල්‍ය රාමුව හා ඇස්තමේන්තුගත සම්පත් සමඟ අයවැය ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ අයවැය වෙන්කිරීම් හා වියදම් පෙළ ගැස්වීමක් සිදු කර නොතිබුණ අතර, කාර්යසාධනය මත පදනම්ව අයවැයකරණ ක්‍රමවේදයක් සිදු කර නොමැතිව වාර්ෂිකව සපුරාගන්නා ඉලක්ක පමණක් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය ලෙස දක්වා තිබුණි.

(ආ) බොහෝ තිරසර අරමුණු ඉටුකිරීමේ මූල්‍ය ප්‍රගතිය දක්වා තිබුණද, මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතිය හා ලබාගත් ජයග්‍රහණවල තිරසාරත්වය එයින් නිරීක්ෂණය කළ නොහැකි වීමෙන් ඉටු කළ කාර්යයන් මඟින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය තහවුරු කරගත නොහැකි විය.

**4.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව තිරසර සංවර්ධන අරමුණු 17 ක් වෙනුවෙන් ක්‍රියාකාරකම් 210 ක් ක්‍රියාත්මක කිරීමට අරමුණු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 163 ක් පමණි.

**5 යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක සම්පත් පැතිකඩ අනුව, විදුලි රහිත නිවාස 2,856 ක්, වැසිකිලි නොමැති නිවාස 4,990ක්, වල වැසිකිලි සහිත නිවාස 2,314 ක්, තාවකාලික නිවාස 2,961 ක් සහ පදිංචියට නිවසක් නැති පවුල් 2,851 ක් පැවතියදී, 2021 පෙබරවාරි 10 දිනැති අංක.MF/NPD/01/2021(i) දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ 1.13 වගන්තිය ප්‍රකාරව සනීපාරක්ෂක පහසුකම් නොමැති නිවාස සඳහා වැසිකිලි පහසුකම් ඇති කිරීම, ස්ථිර නිවාස සඳහා විදුලි පහසුකම් ඇති කිරීම හා පානීය ජල සම්බන්ධතා ලබාදීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.88,241,505 ක ලැබූ ප්‍රතිපාදන මුදලින් සියයට 01 ක් වූ රු.746,960 ක් වන මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

**6. මානව සම්පත් කළමනාකරණය**

**6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 136 | 133 | 03 | - |
| (ii). | තෘතියික මට්ටම | 73 | 51 | 22 | - |
| (iii). | ද්විතියික මට්ටම | 4,936 | 5,153 | - | 217 |
| (iv). | ප්‍රාථමික මට්ටම | 291 | 269 | 22 | - |
| | | 5,436 | 5,606 | 47 | 217 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ප්‍රාථමික මට්ටමේ පිළිවෙලින් තිදෙනෙකු, විසි දෙදෙනකු හා විසි දෙදෙනකු බැගින් තනතුරු පුරප්පාඩු පැවති අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ද්විතියික මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරේ නිලධාරීන් 217 ක් අතිරික්තව පැවතුණි.

(ඇ) විධායක ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ සැලසුම් තනතුරු 02ක්ද, ද්විතීක ශ්‍රේණියේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු 04 ක්ද, පරිපාලන නිලධාරී තනතුරු 10 ක්ද, පරිපාලන ග්‍රාම නාලධාරී තනතුරු 8ක්ද වශයෙන් තනතුරු 24ක ප්‍රමාණයක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

එස්.පී.වීරසිංහ,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

## 4.0 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | අංශය/සංරචකය | අපේක්ෂිත නිමවුමේ (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|
| | | 0%-49% | 50%-74% | 75%-89% | 90%-100% |
| 1 | ප්‍රවේශ මාර්ග ( ජාතික/පළාත්/පාලන/ග්‍රාමීය මාර්ග) | ✓ | - | - | - |
| 2 | ග්‍රාමීය විදුලිය (රැහැන් සහිත විදුලි දිගු) | - | - | - | - |
| 3 | සනීපාරක්ෂක පහසුකම් | ✓ | - | - | - |
| 4 | ක්‍රීඩා පිටි | - | - | - | ✓ |
| 5 | සුළු වාරිමාර්ග | - | - | - | - |
| 6 | ග්‍රාමීය ආර්ථිකය (සතිපොළ/අලෙවි මධ්‍යස්ථානය/ස්වයං රැකියා) | - | ✓ | - | - |
| 7 | ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය | ✓ | - | - | - |
| 8 | සමාජ සුභ සාධනය (අධ්‍යාපන/සෞඛ්‍ය /ප්‍රජාශාලා) | - | ✓ | - | - |
| 9 | නිවාස සංවර්ධනය | - | ✓ | - | - |
| 10 | සුරිය පැනල/විදුලිය (නිවාස ඒකක සඳහා) | - | - | - | - |
| 11 | ග්‍රාමීය ජල සැපයුම් | - | - | - | - |
| 12 | නිල සෙවන | - | - | - | - |
| 13 | වෙනත් | - | ✓ | - | - |

## 05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

| අරමුණු අංකය | අරමුණු | ඉලක්ක අංකය | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 1 | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 | 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයන්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම,වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ආදයම් ලබන අය අන්ත දිළිඳු කණ්ඩායමට අයත්වේ. | 1.1.1 | | 65.41 | |
| | | 1.2 | ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූලවන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවයන්ගේ පෙළෙන සියලුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින්,කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරීම. | 1.2.1 | 42.5 | | |
| | | 1.3 | පහළ මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම හා 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම. | 1.3.1 | 47.88 | | |
| | | 1.අ | විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩි දියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබාදීම කැපිපෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම. | 1.අ.1 | | | 100 |
| 2 | සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2.1 | 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම. | 2.1.1 | | | 88.43 |
| | | | | 2.1.2 | 1 | | |
| | | 2.2 | අවුරුදු 5ට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටි වීම සහ ක්ෂය වීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ලඟාකර ගැනීම ද ඇතුළත්ව 2030 වන විට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්ත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැනු ළමුන්ගේ, ගැබිනි මාතාවන්ගේ, කිරි දෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබා දීම. | 2.2.1 | | | 100 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2.3 | 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ ගොවි පවුල් හා ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායීතාව සහ ආදායම ඉඩම්වලට ආරක්ෂාකාරීම සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන් , දැනුම, මූල්‍ය සේවා, වෙළෙඳපොල සහ වටිනාකම් එකතුකිරීම සහ ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මඟින් දෙගුණ කිරීම. | 2.3.1 | | 57.25 | |
| | | | | 2.3.2 | | | 100 |
| 2 | සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2.4 | 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ කාළගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාළගුණික තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | 2.4.1 | 46.88 | | |
| | | 2.අ | විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා ඉහළ නංවන ලද අන්තර්ජාතික සහයෝගීතාවයෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදුකරන ආයෝජන වැඩිකිරීම. | 2.අ.1 | | 67 | |
| | | 2.ඇ | සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැලැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොලවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | 2.ඇ.1 | | 63 | |
| 3 | නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම | 3.4 | 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේ ක්‍රම මඟින් 1/3කින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම. | 3.4.1 | | 61.77 | |
| | | 3.5 | හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම. | 3.5.1 | | | 100 |
| | | 3.6 | 2030 වන විට මහාමාර්ගවල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාලවීම් සහ මරණ සංඛ්‍යාව අඩුවීම. | 3.6.1 | | | 100 |
| | | 3.8 | මූල්‍යමය අවධානයට පත්වීම සඳහා ආරක්ෂණයද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ හා අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ,එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබා ගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම. | 3.8.1 | 2.2 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 3.9 | 2030 වන විට රසායනික වාතය ජලය හා පස දූෂණය වීමත්,අපිරිසිදු වීමත් නිසා ඇතිවන මරණ සහ රෝගි තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | 3.9.2 | 0 | | |
| | | 3.ඈ | විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළුව සියලුම රටවල ජාතික මට්ටමේ සහ විශ්වීය මට්ටමේ සෞඛ්‍ය අවධානම් සඳහා පූර්ව දැනුම්දීමේ,අවධානම් අවම කිරීමේ සහ කළමනාකරණ කිරීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීම. | 3.ඈ.1 | | | 100 |
| 4 | පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 4.1 | 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයේ සියලුම ගැහැනු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රථමික සහ ද්විතීය අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම. | 4.1.1 | | 74 | |
| | | 4.3 | 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබාගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනයද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම. | 4.3.1 | | | 91.83 |
| | | 4.4 | 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයන් සඳහා තාක්ෂණික සහ වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම. | 4.4.1 | 9 | | |
| | | 4.7 | 2030 වන විට ඉගෙනුම ලබන සියළුම දෙන තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන් මානව අයිතිවාසිකම් සාමය හා ප්‍රචන්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවට සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම ඇතුළත් වේ. | 4.7.1 (1) | | 57.13 | |
| | | 4.අ | ළමුන්,ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම ,වැඩි දියුණු කිරීම සහ සියලුමදෙනාට ආරක්ෂාකාරී,ප්‍රචණ්ඩත්වයෙන් තොර,සියළුදෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවුරු කර දීම. | 4.අ.1(අ) | | | 83.5 |
| 5 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියළු | 5.1 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1 | 46 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.5 | දේශපාලන,ආර්ථික,සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය හා සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගිවීම තහවුරු කිරීම. | 5.5.1 | | 67 | |
| | | | | 5.5.2 | | | 100 |
| 6 | සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම | 6.1 | 2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම. | 6.1.1 | 0.8 | | |
| 8 | සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.1 | ජාතික තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් වසරකට 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම. | 8.1.1 | | | 75.52 |
| | | 8.3 | ඵලදායී ක්‍රියාකාරකම්වලට,සුනිසි රැකියා අවස්ථාවන්ට,ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලිභාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතයකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම.මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමය අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම හා සංවර්ධනය කිරීම දිරිගැන්වීම. | 8.3.1 | 8 | | |
| | | 8.6 | 2020 වන විට අධ්‍යාපනය නොලබන,පුහුණුවක් නොලබන,රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩුකිරීම. | 8.6.1 | | 59 | |
| | | 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියළුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම. | 8.7.1 | | 70 | |
| | | 8.ආ | 2030 වන විට තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබාදීම සඳහා ජගත් මට්ටමින් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම හා අන්තර් ජාතික කම්කරු සංවිධානයේ ජගත් රැකියා සම්මුතිය ක්‍රියාවට නැංවීම. | 8.ආ.1 | | | 99.25 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්න සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම | 9.1 | ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්ම වෙනුවෙන් සියලුදෙනාටම ලබාගත හැකි ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | 9.1.1 | 42.5 | | |
| | | 9.3 | විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොල දාමයන්ට ඒකාබද්ධ කිරීම. | 9.3.1 | | 67.5 | |
| 10 | රටවල් තුළ හා ඒවා අතර අසමානතාවය අඩු කිරීම | 10.2 | 2030 වන විට වයස , ලිංගිකත්වය, ආබාධිත බව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියළු දෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. | 10.2.1 | 46 | | |
| 11 | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11.1 | 2030 වන විට සියළුමදෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම . | 11.1.1 | | | 84.47 |
| | | 11.3 | 2030 වන විට සියලු දෙනා අන්තර්කරණය වූ සහ තිරසර නාගරීකරණය වැඩිදියුණු කිරීම සහ සියළුම රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසර මානව ජනාවාස සැලසුම් කිරීම, සහ කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීම. | 11.3.1 | 0.1 | | |
| | | 11.4 | ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම. | 11.4.1 | | 57.06 | |
| 12 | තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම | 12.2 | 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමානාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිත කිරීම වෙත ලහා වීම. | 12.2.2 | | | 100 |
| 13 | දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මකවීම | 13.1 | සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්භාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණදීමේ හැකියාව ශක්තිමත් කිරීම. | 13.1.1 | 11.925 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 15 | භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | 15.1 | 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම. | 15.1.1 | 0.2 | | |
| | | 15.3 | 2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියඟය සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම්ද ඇතුළුව විනාශයට පත්වූ ඉඩම් සහ පස නැවත යථා තත්ත්වයට පත් කිරීම සහ ඉඩම් විනාශයට පත් නොවන ලෝකයක් ඇතිකර ගැනීම. | 15.3.1 | | 66 | |
| 15 | භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, | 15.5 | ස්වාභාවික වාසභූමි විනාශ වීම අවම කිරීමට කඩිනම් සහ කැපි පෙනෙන ක්‍රියාමාර්ග ගැනීම, ජෛව විවිධත්වයට හානි වීම නැවැත්වීම සහ 2030 වන විට තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ආරක්ෂා කිරීම සහ වදවී යාම වැළැක්වීම. | 15.5.1 | 1 | | |
| | කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | 15.9 | 2030 වන විට ජාතික සහ ප්‍රාදේශීය සැලසුම්වලට,සංවර්ධන ක්‍රියාවලියට,දරිද්‍රතාව පිටුදැකීමේ ක්‍රමෝපායන්ට සහ ගිණුම්වලට පරිසර පද්ධති සහ ජීව විවිධත්වයේ වටිනාකම ඒකාබද්ධ කිරීම. | 15.9.1 | | 51.67 | |
| | | 15.අ | ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියළුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස්කිරීමට උනන්දු කිරීම සහ කැපීපෙනෙන ලෙස වැඩි කිරීම. | 15.අ.1 | | | 100 |
| 16 | තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති | 16.1 | සියළුම ස්ථානයන් හි සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම. | 16.1.1 | | | 100 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැඟීම | 16.2 | ළමුන් කෲර වධහිංසා කිරීම්වලට හා අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියළුම ආකාරයේ ප්‍රචන්ඩත්වයට ලක්වීම අවසන් කිරීම. | 16.2.1 | | | 87.5 |
| | | 16.3 | සියළුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකිවීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ අදිපත්‍ය ප්‍රවර්ධනය කිරීම. | 16.3.1 | | | 91 |
| | | 16.5 | සියළුම ආකාරයේ අල්ලස සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම. | 16.5.1 | | | 83 |
| | | 16.6 | සියළුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිධභාවයෙන් යුත් ආයතන පිහිටුවීම. | 16.6.1 | 0 | | |
| | | | | 16.6.2 | | | 100 |

**05.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග**

2022.04.06 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/202 ප්‍රකාරව රාජ්‍ය වියදම් පාලනය කිරීම යටතේ ඒ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබුනද ආරම්භකර නොතිබූ හෝ බැඳීම් ඇතිකර නොගත් ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවිය. ඒ අන්ව 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති මගින් ඉහළ මට්ටමේ ප්‍රගතියක් ලභා කර ගැනීමට හැකි විය.

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

**06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 2022-12-31 වන දිනට**

| සේවක මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | ( අතිරික්ත ) |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 136 | 133 | 3 | 0 |
| තෘතීයික | 73 | 51 | 22 | 0 |
| ද්විතියික | 4936 | 5153 | 0 | 217 |
| ප්‍රාථමික | 291 | 269 | 22 | 0 |
| **එකතුව** | **5436** | **5606** | **47** | **217** |

**06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබූ ආකාරය**

අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව දිවිතියික මට්ටමේ අතිරික්තයක් පැවතිය ද එය ආයතනයේ කාර්යසාධනයට බලපෑම් කරනු නොලබන අතර දේශිය හා විදේශිය නිවාඩු ලබා ගැනීමට අයදුම් කරන අවස්ථාවලදී එම රාජකාරි ආවරණයට අතිරික්ත නිලධාරීන් යොදා ගනු ලබයි. 2022 වර්ෂයේ පුරප්පාඩු 47ක් පැවතිය ද ප්‍රශස්ත මානව සම්පත් කළමනාකරණය තුලින් උපරිම කාර්යක්ෂමතාවයක් ළභා කර ගෙන ඇත.

**06.3 මානව සම්පත් සංවර්ධනය**

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය | 57 | පැය 12 | 23.620 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 2 | වැඩබිම් පරීක්ෂාව ඇස්තමේන්තු පරීක්ෂාව | 59 | පැය 06 | 12.500 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 3 | ගැටුම් නිරාකරණයේ භාවිතාවන සමතකරණය | 57 | පැය 12 | 26.210 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 4 | භාණ්ඩ සම්ක්ෂණය හා අයවැය පාලනය | 59 | පැය 06 | 15.490 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 5 | කාර්යපටිපාටික රීති | 58 | පැය 06 | 13.795 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 6 | වාහන නඩත්තුව හා කාර්මික දෝෂ හඳුනාගැනීම | 25 | පැය 06 | 9.200 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 7 | වාහන නඩත්තුව හා කාර්මික දෝෂ හඳුනාගැනීම | 30 | පැය 06 | 6.775 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 8 | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සකස් කිරීම | 56 | පැය 06 | 12.370 | | දේශීය | නිලධාරීන් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින පුහුණුව | 33 | පැය 12 | 26.320 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 10 | අභ්‍යන්තර විගණනය හා විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 40 | පැය 06 | 5.230 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 11 | ඵලදායිතාවය හා තත්ත්ව කව | 61 | පැය 12 | 27.060 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 12 | අභ්‍යන්තර විගණනය හා විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 60 | පැය 06 | 22.975 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 13 | සුපිලිපන්න රාජ්‍ය නිලධාරියෙකු සතු ගුණාංග | 60 | පැය 06 | 12.510 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 14 | ව්‍යාපෘති සැලසුම්කරණය | 58 | පැය 12 | 31.355 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 15 | නිවාඩු සම්බන්ධයෙන් වූ ආයතන සංග්‍රහයේ විධිවිධාන | 66 | පැය 06 | 13.710 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 16 | ගැටුම් නිරාකරණයේ භාවිතාවන සමතකරණය | 58 | පැය 12 | 27.855 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 17 | ප්‍රජාව සමග වැඩකිරීමේ කලාව | 56 | පැය 12 | 26.250 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 18 | ඵලදායිතාවය හා | 57 | පැය 12 | 26.250 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | තත්ත්ව කව | | | | | | පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 19 | විනය පරීක්ෂණයක් පැවැත්වීම ප්‍රායෝගික පුහුණුව සහිත | 45 | පැය 06 | 15.110 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 20 | විනය කාර්යපටිපාටිය | 58 | පැය 12 | 29.910 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 21 | සරප් රාජකාරී | 43 | පැය 06 | 14.380 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 22 | වැටුප් පරිවර්තනය | 51 | පැය 12 | 22.345 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 23 | කාර්යපටිපාටික රීති | 58 | පැය 06 | 11.540 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 24 | ITMIS විශේෂ පුහුණුව | 130 | පැය 18 | 56.310 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 25 | මූලික විමර්ශන නිලධාරීන් සඳහා වන දෙදින පුහුණුව | 38 | පැය 12 | 21.625 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 26 | ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය | 56 | පැය 12 | 22.150 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 27 | ප්‍රජාව සමග වැඩකිරීමේ කළාව | 60 | පැය 12 | 27.600 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | පරිදි ඉටු වීම |
| 28 | කාර්යපටිපාටික රීති | 55 | පැය 06 | 13.050 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 29 | විනය පරීක්ෂණයක් පැවැත්වීම ප්‍රායෝගික පුහුණුව සහිත | 43 | පැය 12 | 24.080 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 30 | වාහන නඩත්තුව හා කාර්මික දෝෂ හඳුනාගැනීම පිළිබඳ පුහුණුව | 33 | පැය 06 | 6.950 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 31 | හදිසි මරණ පරීක්ෂණ කටයුතුවලදි හා ඒ හා සම්බන්ධ අධිකරණ රාජකාරිවලදී ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාම නිලධාරීන්ගේ රාජකාරීන් පිළිබඳ පුහුණුව | 60 | පැය 06 | 16.025 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 32 | මානසික සංවර්ධනය හා ආතති කළමනාකරණය පිළිබඳ පුහුණුව | 122 | පැය 06 | 17.690 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 33 | කාර්යාලයේ පරිගණක නඩත්තුවේ දී එදිනෙදා ඇතිවන ගැටළු විසඳීම සඳහා වූ පුහුණුව | 35 | පැය 06 | 19.740 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 34 | කාර්යාලයේ පරිගණක නඩත්තුවේ දී එදිනෙදා ඇතිවන ගැටළු විසඳීම සඳහා වූ පුහුණුව | 34 | පැය 06 | | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 35 | වාර්ෂික ඇස්තමේන්තු | 57 | පැය 06 | 15.100 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සකස්කිරීම පිළිබඳ පුහුණුව | | | | | | පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 36 | ඉසව් කළමනාකරණය පිළිබඳ පුහුණුව | 63 | පැය 06 | 15.830 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය නිසි පරිදි ඉටු වීම |
| 37 | ලිපිගොනු කළමනාකරණය හා ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව | 68 | පැය 06 | 14.925 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 38 | ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණුව | 66 | පැය 06 | 16.840 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 39 | ඉසව් කළමනාකරණය පිළිබඳ පුහුණුව | 56 | පැය 06 | 15.590 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 40 | සරප් ලැබීම් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 60 | පැය 06 | 14.490 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 41 | ග්‍රාම ශක්ති වැඩසටහනට අදාල ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව | 98 | පැය 12 | 40.490 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 42 | අභ්‍යන්තර විගණනය හා විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ | 31 | පැය 06 | 11.080 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පුහුණුව | | | | | | ගත් දැනුම යොදා ගැනීම |
| 43 | ලිපිගොණු කළමනාකරණය පිළිබඳ පුහුණුව | 92 | පැය 06 | 17.975 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| | | | | | | | |

| අනු අංකය | පුහුණුව | සහභාගිවූ සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 01 | මූලික පරිගණක පුහුණුව (Basic Computer) | 64 | පැය 48 | 38.90 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 02 | Internet & E-Mail, Ms Word , Excell, Power Point පුහුණුව | 16 | පැය 18 | 19.55 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 03 | Google Doc, Sheet, Form පුහුණුව | 66 | පැය 72 | 84.80 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 04 | පුද්ගලික ලිපිගොනු පරීශීලනය(Data Base ) පුහුණුව | 30 | පැය 12 | 14.80 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 05 | Payroll (GPS) පුහුණුව | 34 | පැය 60 | 96.49 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |
| 06 | Web Design & Web Update පුහුණුව | 58 | පැය 48 | 63.87 | | දේශීය | නිලධාරින් පුහුණුවීම / පැවරෙන රාජකාරිය සඳහා ලබා ගත් දැනුම යොදා ගැනීම |

★දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි රාජ්‍ය නිලධාරින් සඳහා සකස් කළ 2022 වාර්ෂික පුහුණු සැලැස්ම පදනම් කර ගනිමින් පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීමට කටයුතු කළ අතර, එකී පුහුණු වැඩසටහන් නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද බැවින් ඔවුන්ගේ කාර්යසාධනය,දැනුම, ආකල්ප, කුසලතා ප්‍රවර්ධනය කිරීමෙහිලා ඉවහල් කරගනු ලැබ ඇත.

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අදාල නොවේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උපපත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම(මු.රෙ135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණමුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම. | අදාල නොවේ | | |
| 4.4 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.6 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 4.7 | කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019අනුව, අවම වශයෙන් විගණන හාකළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | ඉන්ධන හිඟය හා රටතුල පැවති වාතාවරණය හේතුවෙන් නිළධාරීන් එක්රැස් කිරීමේ ගැටළුව මත 2022 වර්ෂයේ II | සැළසුම් කළ පරිදි විගණන හා කළමණාකරණ කමිටු පැවැත්වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වන කාර්තුවට අදාළ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නොපැවැත්විනි. | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රාලේඛ අංක 05/2016 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමණාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | පෙර වර්ෂවල අපහරණය කිරීමට සිදුවූ නමුත් මෙතෙක් අපහරණ කටයුතු ප්‍රමාද වූ වාහන පැවතීම | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු. රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016. 12. 29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ටවලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැම්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය ,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව ,රැස් කළ ආදායමෙන් ඇපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් , තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නාවේ | | |
| 16 | **මානව සම්පත් කළමණාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20. 09. 2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ විකල්ප මාර්ග ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන, හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | | |
| 19.4 | ඉහත චක්‍රෙල්ඛයේ 6.5 ඡේදය ප්‍රාකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය.**